සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2020
# නාට්‍ය හා රංගකලාව - I

10 ශ්‍රේණිය — කාලය පැය 01 යි.

නම/ විභාග අංකයඃ

සැලකිය යුතුයි ඃ
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්න සඳහා දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

---

- පහත සඳහන් ගද්‍ය හා පද්‍ය ඇසුරින් අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A - දේව මනුස්සානං අත්ථී
බහු මනුස්සානං අත්ථී

B - පුරසඳ පායා දිලෙන වැනි
මුහුණ තිගේ දිලෙන වැනි මුහුණ තිගේ

C - ගල්ලෙන බිඳලා ලෙන් දොර හැරලා
සිංහබා....... සිංහබා...... සිංහබා........

D - ඇඳුරා - නාන්නේ කොහෙන් ද?
ගුරුන්නාන්සේ - විලකින්
ඇඳුරා - ඕනෑම විලකින් ද?
ගුරුන්නාන්සේ - ඕනෑම විලකින් බෑ. නාමල් විලෙන් වෙන්න ඕන.

E - යකදුරා - ආව්..... ආව්..... හොඳ වැදගත් බඩුවක් වගේ
අනිත් යකදුරෝ - කරකවනව වැඩියි..... යාපනේ භූමි කම්පාව වගේ

01. ඉහත සඳහන් තොරතුරු අනුව එදිරිවීර සරච්චන්ද්‍ර මහතාගේ නාට්‍යයකට අයත් වන්නේ,
(1) B (2) D (3) C (4) A

02. B අක්ෂරයෙන් දැක්වෙන ගායනය දක්නට ලැබෙන්නේ,
(1) දික්තල කාලගෝල නාට්‍යයේ (2) සිංහබාහු නාට්‍යයේ
(3) පුරසඳ නාට්‍යයේ (4) මනමේ නාට්‍යයේ

03. ඉහත ගද්‍ය හා පද්‍ය අතරින් සූනියම් ශාන්ති කර්මයට අයත් වන්නේ,
(1) A (2) B (3) D (4) E

04. සන්නි යකුම් යාගයේ ඇතුලත්වන කොටසකි,
(1) A (2) D (3) E (4) B

05. රටයකුම යාගයේ අන්තර්ගත කොටසක් වන්නේ,
(1) D (2) E (3) A (4) C



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

06. චරිතයකට ආරෝපණය වී කිසියම් කාල සීමාවක් තුළ එහි ජීවත් වීමේ නළු කාර්ය හඳුන්වනු ලබන්නේ,
    (1) අභිරූපනය ලෙස (2) රූපනය ලෙස (3) අනුකරණය ලෙස (4) අනුරූපණය ලෙස

07. රූපන ශිල්පියෙකු සතු ගුණාංගයන් වන්නේ,
    (1) රූප සම්පත්තියෙන් යුතුවීම (2) අනුකරණ හැකියාවෙන් යුක්තවීම
    (3) පලපුරුදු බව (4) අමාරුකම් ගණන් නොගැනීම

08. රූපන ශිල්පියෙකු විසින් ප්‍රගුණ කළ යුතු අංශ ගණන වන්නේ,
    (1) හතරකි (2) පහකි (3) අටකි (4) දෙකකි

09. පෙර සූදානමකින් තොරව කරනු ලබන රූපනය වන්නේ,
    (1) අභිරූපන (2) ක්ෂණික නිරූපන (3) ඒකල නිරූපන (4) අනු නිරූපන

10. පහත දැක්වෙනුයේ දික්තල කාලගෝල නාට්‍යයේ රඟදක්වනු ලබන චරිතයි.
    (1) දික්තලා, කාලගෝල, බ්‍රහ්මදත්ත (2) බ්‍රහ්මදත්ත, චන්තු දත්ත, කාලගෝල
    (3) කාලගෝල, චන්තු දත්ත, මහෞෂධ (4) මහෞෂධ, කාලගෝල, දික්සුරඹී

11. ''පොත පතේ මිස කුස පබාවතීලා අප අතර කොයින් ද........''
    ඉහත ප්‍රකාශය කරනු ලබන්නේ,
    (1) චන්තු දත්ත (2) මහෞෂධ (3) කාලගෝල (4) දික් පිටියා

12. දික්තල කාලගෝල නාට්‍යයේ දක්නට ලැබෙන නාඩගම් ලක්ෂණයකි,
    (1) මද්දලය වාදනය (2) රංග කාලය සීමාවීම
    (3) ස්ත්‍රී චරිතය ස්ත්‍රීන් කිරීම (4) පසුතල නිර්මාණ අවම වීම

13. දික්තල කාලගෝල නාට්‍යයේ සංගීතය නිර්මාණය කර ඇත්තේ,
    (1) චාල්ස් සිල්වා ගුණසිංහ (2) පුන්‍යසේන ගුණසිංහ
    (3) ඊ. ආර්. සරච්චන්ද්‍ර (4) රිචඩ් මානමුදලි

14. අංග රචනා කට්ටලයක අඩංගු ද්‍රව්‍යයකි,
    (1) ස්පොන්ච් (2) බ්‍රෂ් (3) පෑන්කේක් (4) කතුර

15. අංග රචනා සඳහා බෙදන මුහුණේ කලාප වලට අයත් නොවන්නේ,
    (1) කණ (2) ඇස (3) නාසය (4) නිකට

16. අංග රචනයේ දී මුහුණේ රැවුල් ඇලවීම සඳහා යොදාගනු ලබන්නේ,
    (1) බයින්ඩර්ගම් (2) කිරිගම් (3) ස්ප්‍රිට් ගම් (4) රිමූවින් ක්‍රීම්

17. 'චරිතාංග අංග රචනයට' නිදසුනකි,
    (1) තලමල පිපිලා නාට්‍යයේ මහේෂිකා (2) මනමේ නාට්‍යයේ වැදි රජු
    (3) නරිබෑනා නාට්‍යයේ ගමදුව (4) කදා වළලු නාට්‍යයේ සිටුදුව

18. නාට්‍යයක අංග රචනා කාර්ය පැවරුණහොත් ඔබ මුලින්ම කරනු ලබන්නේ,
    (1) අංග රචනා කට්ටලයක් සොයාගැනීම
    (2) මුහුණේ කලාප වෙන්කර ගැවීම
    (3) නළු නිළියන් හමුවීම
    (4) නාට්‍යයේ ස්වභාවය හා චරිත පිළිබඳ අධ්‍යයනය

- **අංක 19 සිට 22 දක්වා ප්‍රශ්නවලට පහත සඳහන් පින්තූර ඇසුරින් පිළිතුරු සපයන්න.**



A B C D

19. කුවේණි නාට්‍ය සඳහා රංගනයෙන් දායක වී ඇත්තේ,

(1) B (2) A (3) C (4) D

20. රඟපෑමෙන් මෙන්ම අධ්‍යක්‍ෂණයෙන් නාට්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ වන්නේ,

(1) B (2) C (3) D (4) A

21. 'රතු හැට්ටකාරී' නාට්‍යයට සම්බන්ධ වී ඇත්තේ,

(1) C (2) D (3) A (4) B

22. ගුවන්විදුලි නාට්‍යය තුළින් වඩාත් ජනප්‍රිය ශිල්පියා වන්නේ,

(1) A (2) B (3) C (4) D

- **අංක 23 සිට 26 දක්වා ප්‍රශ්න වලට පහත සඳහන් වගුව ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

| ක | ග | ජ | ට |
|---|---|---|---|
| කුවේණි | රතු හැට්ටකාරී | සිංහබාහු | අහසින් වැටුණු මිනිස්සු |
| හුණුවටයේ කතාව | තාරාවෝ ඉගිලෙති | මහාසාර | මනරංජන වැඩ වර්ජණ |
| අපට පුතේ මඟක් නැතේ | කුවේණි | හස්තිකාන්ත මන්තරේ | තට්ටු ගෙවල් |
| ජනේලය | දැවැද්දෝ | එලොව ගිහින් මෙලොව ආවා | දැවැද්දෝ |

23. මානෙල් ජයසේන මහත්මිය රංගනයෙන් දායක වූ නාට්‍ය ඇතුළත් වන්නේ,

(1) ග (2) ක (3) ට (4) ජ

24. මහාචාර්ය සරච්චන්ද්‍රයන්ගේ නාට්‍ය නිර්මාණ ඇතුළත් වන්නේ,

(1) ක (2) ග (3) ජ (4) ට

25. ලෝක ධර්මී නාට්‍ය පමණක් ඇතුලත් වන්නේ,

(1) ට (2) ජ (3) ග (4) ක

26. අනුලා බුලත්සිංහල මහත්මිය රංගනයෙන් දායක වූ නාට්‍ය ඇතුළත් වන්නේ,

(1) ක (2) ජ (3) ට (4) ග

- **අංක 27 සිට 30 දක්වා ප්‍රශ්න වලට නොගැලපෙන වරණය තෝරන්න.**

27. රංග ක්‍රීඩාවක් නොවන්නේ,

(1) මකර වලිගය (2) මීයෝ පූසෝ

(3) රාක්‍ෂයෙක් ගමට ඇවිල්ලා (4) බාස්කට් බෝල්

28. දික්තල කාලගෝල නාට්‍යයේ එන ගායනයක් නොවන්නේ,

(1) අම්බරේ සඳ සේ දිලී (2) රුසිරු ළඳුනි ඔබ ප්‍රේමයෙනා

(3) පුර සඳ පායා දිලෙන වැනි (4) රතදර සිරියා පරදන

29. වේදිකා නාට්‍යයක සුවිශේෂතාවක් නොවන්නේ,

(1) සජීවී බව (2) පෙළ සාහිත්‍යයක් තිබීම

(3) පාඨකයන් පිරිසක් සිටීම (4) සාමූහික බව

30. ඩග්ලස් රණසිංහ මයා රඟපෑ නාට්‍යයක් නොවන්නේ,

(1) කුවේණි (2) හොටබරි යුද්දේ (3) ඩුං ඩුං බෙරේ (4) කුස පබාවතී

- **අංක 31 සිට 40 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරන්න.**

31. 'අනේ අබ්ලික්' නාට්‍යයේ රඟපාමින් නාට්‍ය ක්ෂේත්‍රයට පිවිසි රංගන ශිල්පියා වන්නේ,

(1) විජය නන්දසිරි (2) ජැක්සන් ඇන්තනී (3) ගාමිණී සමරකෝන් (4) ශ්‍රියන්ත මෙන්ඩිස්

32. රංගන ශිල්පියෙක් ලෙස හැඳින්විය හැක්කේ,

(1) ඩග්ලස් රණසිංහ (2) එදිරිවීර සරච්චන්ද්‍ර (3) කේ. බී. හේරත් (4) සුගතපාල ද සිල්වා

33. දික්තල කාලගෝල නාට්‍යයට පාදක වූයේ,

(1) චුල්ල ධනුද්දර ජාතකය (2) උම්මග්ග ජාතකය

(3) සේරි වාණිජ ජාතකය (4) සුතසෝම ජාතකය

34. 'ක්ෂණික නිරූපනයට' භාවිතා වන වෙනත් නමකි,

(1) අභිරූපන (2) එසැන නිරූපන (3) ඒකල රූපන (4) අනු රූපන

35. නාට්‍යමය අවස්ථාවක ඇති ගුණාංගයක් වන්නේ,

(1) යම්කිසි ගැටළුකාරී අවස්ථාවක් තිබීම (2) ඇඳුම් පැළඳුම් අලංකාරව යොදා තිබීම

(3) ගායනය බහුල වීම (4) රංග උපකරණ යොදාගෙන තිබීම

36. පහතරට සම්ප්‍රදායේ කාන්තාවන් වෙනුවෙන් පවත්වන ශාන්ති කර්මය වනුයේ,

(1) කිරි මඬුව (2) සන්නි යකුම (3) රටයකුම (4) පහන් මඬුව

37. නාට්‍ය කලාවේ පැවැත්ම සඳහා කටයුතු කළ රංගන ශිල්පියෙකි,

(1) එදිරිවීර සරච්චන්ද්‍ර (2) බන්ධුල ජයවර්ධන

(3) දයානන්ද ගුණවර්ධන (4) විජේරත්න වරකාගොඩ

38. වේදිකා නාට්‍යයක දැකිය හැකි සුවිශේෂතාවක් නොවන්නේ,

(1) පෙළ සාහිත්‍යයකි තිබීම (2) සෘජු ප්‍රේක්ෂක ප්‍රතිචාර ලැබීම

(3) ගබඩා කර තබාගත හැකිවීම (4) සාමුහික බව

39. නාට්‍ය ධර්මී ලක්ෂණයක් නොවන්නේ,

(1) ගමන්තාල (2) රිද්මානුකූල සංවාද

(3) පොතේ ගුරු චරිතය තිබීම (4) සැබෑ පසුතල භාවිතය

40. නාට්‍ය දර්ශණයක දී ඉතාමත් වැදගත් පිරිස වන්නේ,

(1) අනුශාංගික ශිල්පීන් (2) සුහපතන්නන් (3) ප්‍රේක්ෂකයන් (4) ප්‍රචාරක අංශය

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2020

10 ශ්‍රේණිය **නාට්‍ය හා රංගකලාව - II** කාලය පැය 02 යි.

නම/ විභාග අංකයඃ

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01 දික්තල කාලගෝල නාට්‍යයේ පෙළ ඇසුරින් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(i) දික්තල කාලගෝල නාට්‍ය නිර්මාණය කිරීම සඳහා යොදාගෙන ඇති සම්ප්‍රදාය හා ශෛලිය නම් කරන්න. (ලකුණු 02)

(ii) එහි ප්‍රධාන චරිත දෙක නිරූපනය කළ ශිල්පියකු හා ශිල්පිණියක නම් කරන්න. (ලකුණු 02)

(iii) දික්තල කාලගෝල නාට්‍යයේ නාමිකව පවතින චරිත දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(iv) දික්තල කාලගෝල නාට්‍යයේ දක්නට ලැබෙන නාට්‍ය ධර්මී ලක්ෂණ දෙක්ක ලියන්න. (ලකුණු 02)

(v) දික්තල කාලගෝල නාට්‍යයේ ගැටුම් අවස්ථා දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(vi) දික්තල කාලගෝල නාට්‍යයේ පෙළ රචකයා යා නිෂ්පාදකවරයා නම් කරන්න. (ලකුණු 02)

(02) (i) ඔබ නැරඹූ වේදිකා නාට්‍ය දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) වේදිකා නාට්‍යයක දැකිය හැකි සුවිශේෂතා 4 ක් නම් කරන්න. (ලකුණු 04)

(iii) 'වේදිකා නාට්‍ය යනු බොහෝ ශිල්පීන් පිරිසකගේ සාමූහික ක්‍රියවක ප්‍රතිඵලයකි.' මෙය සනාථ කිරීම සඳහා ඔබේ අදහස විස්තර කරන්න. (ලකුණු 06)

(03) (i) 'රූපනය' යනු කුමක්දැයි නිර්වචනය කරන්න. (ලකුණු 02)

(ii) රූපනයේ දී නළුවෙකු විසින් ප්‍රගුණ කළ යුතු අංශ දෙක කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii) රූපන ශිල්පියෙකු සතුවිය යුතු කුසලතා හා ගුණාංග මොනවා දැයි විස්තර කරන්න. (ලකුණු 06)

(04) (i) අංග රචනය ප්‍රධාන වශයෙන් කොටස් කීයකට බෙදේ ද? ඒ මොනවා ද? (ලකුණු 02)

(ii) අංග රචනය සඳහා යොදාගන්නා ද්‍රව්‍ය ලැයිස්තුවක් සකසන්න. (ලකුණු 04)

(iii) වේදිකා නාට්‍යයක අංග රචනය ඔබට පැවරුනහොත් ඔබ අනුගමනය කරන ක්‍රියා විස්තර කරන්න. (ලකුණු 06)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

(05) (i) දේශීය නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වූ රංගනන ශිල්පීන් දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 02)

(ii) එම ශිල්පීන් රංගනයෙන් දායක වූ නිර්මාණ දෙක බැගින් නම් කරන්න. (ලකුණු 04)

(iii) ඉන් එක් රංගන ශිල්පියෙකු පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 06)

(06) (i) පහතරට සම්ප්‍රදායේ එන සූනියම් ශාන්ති කර්මය සඳහා භාවිතා වන වෙනත් නම් දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) එම ශාන්ති කර්මය වර්තමානයේ පවත්වන්නේ කුමක් අරමුණු කරගෙන ද යන්න කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

(iii) එහි ඇතුළත් නාට්‍යමය පෙළපාලියක් නම් කර ඒ තුළ පවතින නාට්‍යමය ලක්ෂණ මොනවා දැයි විස්තර කරන්න. (ලකුණු 06)

(07) පහත සඳහන් කථා සැකිල්ල ඉදිරියට ගෙන යමින් නාට්‍යයකට සුදුසු පෙළ රචනයක් ලියන්න.

විදෙස්ගතව සිටින මවගෙන් ලිපියක් බලාපොරොත්තුවෙන් සිටින චංචලා තම පියාගේ දෙවන විවාහයේ බිරිඳගේ තාඩන පීඩනවලට ලක්ව සිටින්නියකි. එදින ලද නිමේෂයේ දී ලියුම් පෙට්ටිය හැර බලන ඇය ......

(i) දෙබස් සංවාද සහිතව පෙළ රචනයට (ලකුණු 04)

(ii) නාට්‍යෝචිත අවස්ථා නිර්මාණයට (ලකුණු 04)

(iii) මාතෘකා හා ආදර්ශවත් නිමාව (ලකුණු 04)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2020

## 10 ශ්‍රේණිය නාට්‍ය හා රංගකලාව ප්‍රායෝගික පරීක්ෂණය

| නම/ විභාග අංකය: |
|---|

01. දික්තල කාලගෝල නාට්‍යයේ ඔබ කැමති චරිතයක් නිරූපනය කරන්න. (ලකුණු 10)

02. ගුරු අභිමතය පරිදි ලෝක ධර්මී සංවාද කොටසක් නිරූපනය කරන්න. (ලකුණු 10)

03. ඔබ කැමති නාට්‍ය ගීතයක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කරන්න. (ලකුණු 15)

04. පහත සඳහන් චරිතයක් උපයෝගී කරගෙන ක්ෂණික නිරූපනයක් කරන්න.

(1) පූජකයෙක් (2) යකදුරෙක් (3) ශාස්ත්‍රකරුවෙක්

(4) බස් කොන්දස්තරවරයෙක් (5) යාචකයෙක් (ලකුණු 20)

05. ඔබ දන්නා කතාන්දරයක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කරන්න. (ලකුණු 20)

06. පහත සඳහන් මාතෘකාවක් තෝරාගෙන සමූහ නිරූපනයක් ඉදිරිපත් කරන්න.

(1) මනමාලයා නොපැමිණි මඟුල ගෙදර.

(2) ගමදුව හා නරියා බැහැදැකීමට ගිරිහෙල් අරණට ගිය ගම ගෙදර පිරිස.

(3) නව යුවල පිළිගැනීම සඳහා කාලගෝලගේ ගෙදර සිටින නෑදෑ පිරිස.

(4) සමූහ ඡායාරූපයකට පෙනී සිටින පෙර පාසල් සිසුන් පිරිසක්.

(5) පන්ති කාමරයට සර්පයෙකු පැමිණීම.



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(3) | 2 -(1) | 3 -(1) | 4 -(3) | 5 -(1) | 6 -(2) | 7 -(4) | 8 -(4) | 9 -(2) | 10 -(3) |
| 11-(4) | 12 -(1) | 13 -(2) | 14 -(3) | 15 -(1) | 16 -(3) | 17 -(2) | 18 -(4) | 19 -(1) | 20 -(3) |
| 21-(1) | 22 -(2) | 23 -(2) | 24 -(3) | 25 -(1) | 26 -(4) | 27 -(4) | 28 -(2) | 29 -(3) | 30 -(1) |
| 31-(4) | 32 -(1) | 33 -(2) | 34 -(2) | 35 -(1) | 36 -(3) | 37 -(4) | 38 -(3) | 39 -(4) | 40 -(3) |

(නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින්)

## II කොටස

01. (i) නාඩගම් සම්ප්‍රදාය
නාට්‍ය ධර්මී ශෛලිය (ලකුණු 02)
(ii) ශිල්පියා - උදේනි චන්ද්‍රසිරි, රිචඩ් මානමුදලි, සමන් ගුණසිංහ, ඉසුරු වීරසිංහ
ශිල්පිණිය - චන්ද්‍රාණි පතිරණ, මැණිකේ අත්තනායක, මාදනී මල්වත්ත, තුෂාරී ගුණරත්න (ලකුණු 02)
(iii) කයිදා, චමරි, හේතුපානි, දික්සුරඹි, දන්ත චූල, චූල දන්ති, කිරි සන්ද්‍ර, සෙම්බරී (ලකුණු 02)
(iv) ගමන් තාල, පොතේ ගුරු චරිතය තිබීම, ගායනය බහුල වීම, රිද්මයානු කූල සංවාද පවැතීම, පසුතල නිර්මාණ නොමැතිවීම ....... ආදී දෙකක් සඳහා (ලකුණු 02)
(v)
- ⋆ කාලගෝල හා දික්තලා අතර රූප ශෝභාව පිළිබඳ ඇතිවන ගැටුම.
- ⋆ කාලගෝල හා දික්පිටියා අතර ඇතිවන ගැටුම.
- ⋆ දික්තලා කාලගෝල අතහැරීම පිළිබඳව ඇගේ සිත තුළ ඇතිවන ගැටුම .... ආදී 02 ක් සඳහා ලකුණු 02

(vi) චාල්ස් සිල්වා ගුණසිංහ ගුරුන්නාන්සේ - පෙළ රචක
පුන්‍යසේන ගුණසිංහ - නිෂ්පාදක (ලකුණු 02)

02. (i) ප්‍රසිද්ධ වේදිකා නාට්‍ය දෙකක නම් ලිවීම සඳහා (ලකුණු 02)
(ii) සජීවී බව, පෙළ සාහිත්‍යයක් තිබීම, සෘජු ප්‍රේක්ෂක සහයෝගීත්වය, සාමූහික බව, ගබඩාකර තබාගත නොහැකිවීම, ගතික බව ආදී කරුණු 04 ක් සඳහා (ලකුණු 04)
(iii) පෙළ රචක, නළු නිළියන්, අංගරචනා හා වේෂභූෂණ ශිල්පීන් නිෂ්පාදක, අධ්‍යක්ෂ, පෙළ මතක් කරන්නන්, වේදිකා පරිපාලක සංගීත හා අලෝකකරණ ශිල්පීන්........ ආදී සමූහයකගේ එකතුවෙන් නාට්‍ය වේදිකා ගතවන බව විස්තර කිරීම සඳහා (ලකුණු 02)

03. (i) යම්කිසි චරිතයටක ආරෝපණය වී කිසියම් කාලයක් තුළ එහි ජීවත්වීමේ නළු කාර්ය රූපනයයි. (ලකුණු 02)
(ii) (1) අභ්‍යන්තරික ප්‍රකාශනය (සිත)
(2) බාහිර ප්‍රකාශනය (කටහඬ හා ශරීරය) මෙය විස්තර කර ඇත්නම් (ලකුණු 04)
(iii) වෙහෙසීම, අමාරුකම් ගණන් නොගැනීම, දැඩි ආත්ම ශක්තිය, පරිකල්පන හැකියාව ආදී කරුණු විස්තර තර තිබේ නම් (ලකුණු 06)

04. (i) දෙකකට
(1) සරල අංග රචනය
(2) චරිතාංග අංග රචනය (ලකුණු 02)
(ii) පදනම් ආකල්පය, ග්‍රීස්පේන්ට්, ලයිනින් කලර්ස්, ලිප්ස්ටික්, අයිබ්‍රෝ පෙන්සිල් ...... ආදී ද්‍රව්‍ය ලැයිතුවක් සඳහා (ලකුණු 04)
(iii) නාට්‍ය පෙළ අධ්‍යයනය, චරිතය පිළිබඳ අවබෝධය ලබා ගැනීම අධ්‍යක්ෂවරයා සමඟ සාකච්ඡාව, මුහුණ පිරිසිදු කිරීම, පදනම් ආලේපය තැවරීමේ සිට විස්තර කිරීම සඳහා (ලකුණු 06)

05 (i) අනුලා බුලත්සිංහල, මැණිකේ අත්තනායක, ජැක්සන් ඇන්තනී, ශ්‍රියන්ත මෙන්ඩිස් ...... ආදී නළු නිළියන් දෙදෙනෙක් නම් කිරීම. (ලකුණු 02)
(ii) ඔවුන් රඟපෑ නාට්‍ය දෙක බැගින් නම් කිරීමට (ලකුණු 04)
(iii) ඉන් එක් රංග ශිල්පියෙකු පිළිබඳ විස්තර කිරීමට (ලකුණු 06)

06. (i) මැණික් පාල ශාන්තිය, ඔඩ්ඩිස යාගය (ලකුණු 02)
(ii) අණවින, කොඩිවින, හදි හූනියම් ආදිය කැපීම සඳහා (ලකුණු 04)
(iii) වඩිග පටුන
සංවාද භාවිතය, අනුකරණය, උත්ප්‍රාසය, දූන වීම, සතර අභිනය භාවිතය සමාරෝපය ආදී ලක්ෂණ පිළිබඳ විස්තර කිරීම සඳහා (ලකුණු 06)

07. (i) දෙබස් හා සංවාද සහිත පෙළ රචනයට (ලකුණු 04)
(ii) නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය (ලකුණු 04)
(iii) මාතෘකාව හා ආදර්ශවත් නිමාව (ලකුණු 04)